# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த.பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 720/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 27/04/2024<br>පැය 1250 |

**මාධ්‍ය නිවේදනය**

**මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බියගම පොලිස් ස්ථානය.**

2024.04.26 වන දින රාත්‍රී කාලයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරක් මත බණ්ඩාරවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 310 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 310 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 40 වයස් වල පසුවන කඩුවෙල හා සියඹලාපේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ .

ඉහත සැකකරුවන් අත්අඩංගුවට ගැනීමෙන් පසු අනාවරණය කරගත් තොරතුරු මත බණ්ඩාරවත්ත ප්‍රදේශයේ දී තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර එම සැකකරු පදිංචි නිවස සහ නිවසේ තිබූ කාර් රථය පරීක්ෂා කිරීමේදී එහි තිබී **අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 15 ග්‍රෑම් 81 ක්, හැෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 14 ග්‍රෑම් 527 ක් හා හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 941 ක්** සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන බෝමිරිය, කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බියගම පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාළ ඡායාරූප කිහිපයක් මේ සමඟ එවමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**